කඩුවෙල මහා නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 02 දින සභාවේ නාගරික කොමසාරිස්වරිය වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) H 68452324024 දරන ව්‍යාපෘතිය සඳහා චෙක්පතින් ලද රු.486,294 ක් නොසලකා රු.500,000 ක් ණය ගැති ලෙස දැක්වීමෙන් වර්ෂයේ ආදායම් ආධාර ගිණුම සහ ණයගැති ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.44,838 ක් වූ චෙක්පත් 10 ක් ආදායමට ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මිලදී ගනු ලැබූ වටිනාකම රු.133,444 ක් වූ තොග අයිතමයන් 2 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් තොගයේ අගය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2013 සහ 2014 වර්ෂ සඳහා මුද්දර ආදායම් ලෙස ප්‍රතිපාදනය කල මුදල ඉක්මවා, ලද ආදායම වූ රු.168,646,261 කින් ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ණයගැති ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කපා හැරිය යුතු සේවක වැටුප් රු.15,262,972 ක් ගිණුම් වලින් ඉවත් නොකිරීම හේතුවෙන් ණයගැති ගිණුම හා සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ජයවඩනගම ප්‍රජා ශාලාව කුලියට දීමෙන් ලැබිය යුතු හිඟ මුදල කුලීකරු විසින් ලබාගත් විදුලි සම්බන්ධතාවය සඳහා හිලව් කිරීමේදී සමුච්චිත අරමුදලට හර කිරීම වෙනුවට සහනාධාර ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.170,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) ගෙවා තිබූ රු.81,227 ක් ණයහිමි ගිණුමට හර නොකිරීම හේතුවෙන්, ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද සමුච්චිත අරමුදල අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඌ) 2013 / 2014 වර්ෂයන්හිදී ඉදිකිරීමට ණයහිමි ප්‍රතිපාදනය කර තිබියදි යෝජිත කර්මාන්ත 15 ක ඉදිකිරීම අවලංගු කිරීම වෙනුවෙන් ගිණුම් සටහන් නොයෙදීම හේතුවෙන් රු.8,349,374 කින් ණයහිමි ශේෂය වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සත්‍ය පිරිවැය රු.2,598,159 ක් වූ කර්මාන්ත 04 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද ණයහිමි වටිනාකම වූ රු.1,760,779 ක් ණයහිමි ගිණුමෙන් ඉවත් නොකිරීම හේතුවෙන් ණයහිමි ශේෂය හා සමුච්චිත අරමුදල රු.1,760,779 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) වැඩිපුර අයකර ගනු ලැබූ සේවක ණය රු.32,952 ක්, මූලික ණය ශේෂයට එරෙහිව කපා හැරීම හේතුවෙන්, ලැබිය යුතු සේවක ණය ශේෂය රු.32,952 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) ආයුර්වේද තොගය තුල ඇතුලත්ව තිබූ කල් ඉකුත් වූ තොගයේ වටිනාකම ගණනය කර තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සභාවට අයත් පුස්තකාල 03හි අස්ථානගත වූ පොත් 522 ක වටිනාකම වූ රු.110,035 ක් සහ ගංවතුරින් විනාශ වූ පොත් 18 ක වටිනාකම වූ රු.5,355 ක් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාළව අවසන් ගිණුම් අනුව ශේෂය රු. **819,172,486** ක් හා අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂය රු.**793,343,701** ක් වුයෙන් රු.**25,920,185** ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------**---**

එකතුව රු.478,860,653 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ විගණන සාක්ෂි නොමැති වීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කළ නොහැකි විය.

2 මූල්‍ය සමාලෝචනය

-----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.513,259,716 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.330,502,111 ක් විය.

2.**2** බැංකු සැසඳුම්

---------------

(අ) දීර්ඝ කාලයක සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති ගිණුම් අංක **PB 163869561** (මහජන බැංකුව) දරන ජංගම ගිණුමේ ඉදිරිපත් නොවූ චෙක්පත්, උපලබ්ධි නොවූ ලැබීම් සහ හඳුනා නොගත් ගෙවීම් වශයෙන් සඳහන් රු. 1,374,084 ක් වූ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 1700010082 (මහජන බැංකුව) දරන ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු. 125,461 ක් වූ අතර එය හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

---------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | තථ්‍ය අයකර ගත යුතු | බිල් කිරීම | තථ්‍ය අයකර ගත් | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකර ගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 59,206,698 | 126,882,732 | 132,744,987 | 53,344,443 | 180,019,909 | 113,144,239 | 19,358,562 | 63,929,295 |
| කුලී ආදායම් | 399,586 | 9,120,182 | 9,348,190 | 171,578 | 13,600,834 | 11,319,667 | 1,348,749 | - |
| බලපත්‍ර ගාස්තු | - | 13,071,172 | 13,071,172 | - | 11,161,970 | 11,161,970 | - | - |

### 2.3.2 වරිපනම්

(අ) දිර්ඝ කාලයක සිට ගෙවීම් පැහැර හැර තිබුනු දේපල මගින් අය විය යුතු වරිපනම් හිඟය රු.766,806 ක් වූ අතර මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 254 (අ) (2) වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1735/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය (බස්නාහිර පළාත් සභාව) ප්‍රකාරව කඩුවෙල මහා නගර සභා බලප්‍රදේශය තුල පවතින සෑම සිනමා ශාලාවක් විසින් ම 2013 ජනවාරි 01 දින සිට ප්‍රවේශ පත්‍රයකින් සියයට 15 ක විනෝද බද්දක් අය කර ගත යුතු වුවද සභා බලප්‍රදේශය තුල පවතින සිනමා ශාලා 04 න් 2016 අගෝස්තු 30 දිනට අයවිය යුතු රු. 5,920,171 ක් වූ විනෝද බදු මුදල් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

### 2.3.3 විනෝද බදු

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතට අනුව සභා බල ප්‍රදේශය තුල පවතින සිනමාශාලා 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට බිල් කළ විනෝද බදු මුදල රු.4,344,767 ක් විය. ඉන් රු.1,951,397 ක් වර්ෂය තුළ අය වී තිබුණි. වර්ෂය ආරම්භයේ තිබූ රු.5,122,723 ක් වූ හිඟය වර්ෂය අවසාන වන විට රු.7,516,093 ක් දක්වා වර්ධනය වී තිබුණි. විනෝද බදු ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, නොගෙවා පැහැර හරින හිඟය සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට හෝ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 කඩකුලි

කඩුවෙල මහා නගර සභාවට අයත් පොදු වෙළඳ පොල කඩ කාමර කුලී 2001 වර්ෂයේ තක්සේරුව අනුව අයකරනු ලබන අතර වෙළඳසැල් සියල්ලෙහිම වාර්ෂික කුලිය රු.237,900ක් විය. 2017 මැයි 26 දින එවන ලද නව තක්සේරුව අනුව වාර්ෂික කුලිය රු.2,709,600 ක් විය.මේ අනුව නියමිත කාලය තුලදී තක්සේරු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව මිලියන දෙකකට වඩා මුදලක් වර්ෂ 10 ක් තිස්සේ සභාවට අහිමි වි තිබුණි. මෙම කඩකාමර වෙනුවෙන් 1984 වර්ෂයෙන් පසුව ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

2.3.5 සංවර්ධනය නොකල ඉඩම් මත බදු අය කිරීම

2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමට 2014 නොවැම්බර් 17 දින ගැසට් කර තිබූ නමුත්,කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලයට අදාලව 2016 වර්ෂය තුළදී ඉහත කී බදු අය කිරීම් සිදු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වරිපනම් හා පුස්තකාල මෘදුකාංගය

මෙම මෘදුකාංග පද්ධතිය මිලදි ගැනිම වෙනුවෙන් 2016 වර්ෂය වනවිට රු.824,000 ක් ගෙවා තිබුණද පුස්තකාල මෘදුකාංගය විද්‍යානුකූලව ගොඩනැගී නොමැති බැවින් දැනට භාවිතයට නොගන්නා අතර වරිපනම් ගිණුම්කරණ මෘදුකාංගය ජාලගත කර නොතිබුණි.

(ආ) සතිපොල නැවත ප්‍රතිස්ථාපනය කිරිම

කඩුවෙල පොල ප්‍රතිස්ථාපනය කිරිම සඳහා හෙක්ටයාර් 0.98211 ක් වූ ඉඩම අත්පත්කර ගැනිමට (රුක්අත්තන ඕවිට සහ හකුරුගේ කුඹුර නැමති ඉඩම) රුපියල් මිලියන 80 ක මුදලක් 2014 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුනද 2017 ජුනි 30 වන තෙක්ම නගර සභාව වෙත ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් මහ නගර සභා ආඥා පනතේ 228 වගන්තිය ප්‍රකාර උක්ත කටයුත්ත සඳහා දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ගිනි නිවීම් සේවාවක් පවත්වාගෙන යාම

පළාත් පාලන කොමසාරිස්ගේ 2012 අගෝස්තු 14 දිනැති චක්‍රලේඛ අංක LGD/05/11 V**ol** V යටතේ ගිනි නිවීමේ හා මුදා ගැනීමේ සේවාව ලබා ගැනීම සඳහා සභාව විසින් පර්ශද ගිනි නිවීම් ඒකකය වන ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාවේ ගිනි නිවීම් ඒකකය සමග ගිවිසුම් ගත වී නොතිබුණි.

(ඉ) බත්තරමුල්ල පොදු වෙළඳපොල ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගැනීම

සභාවට අයත් බත්තරමුල්ල පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 70 ක් 2011 මාර්තු 27 දින නාගරික සංවර්ධන අධිකාරිය මගින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණි. 2015 වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මෙම පොදු වෙළඳසැලෙන් ඉවත් වී තිබුණ ද මෙකී කඩ කාමර ආපසු සභාව වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. මෙකී කඩ කාමර අහිමි වීම නිසා සභාවට දළ වශයෙන් රු.3,360,000ක මූල්‍ය අලාභයක් සිදුව තිබුණි.

(ඊ) සේවක ණය

2016 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.44,393,408 ක් වූ අතර ඉන් ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 29 දෙනෙකුගෙන් රු.1,649,221 ක් විශ්‍රාම ගිය සේවකයින් 21 දෙනෙකුගෙන් රු.96,177 ක් සේවය අතහැර ගිය සේවකයින් 45 දෙනෙකුගෙන් රු.425,531 ක් සේවය අත්හිට වූ සේවකයින් 13 දෙනෙකුගෙන් රු.133,348 ක් හා මිය ගිය සේවකයින් 38 දෙනෙකුගෙන් රු.266,667 ක් ද අයවිය යුතුව තිබුණි. එම හිඟ ණය ශේෂ

අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබූ අතර හිඟ ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අලුත් වැඩියා තත්වයේ පවතින එකතු වටිනාකම රු.1,325,000 ක් වූ ට්‍රේලර් 3 ක් හා වටිනාකම සොයා ගත නොහැකි ට්‍රේලර් 04 ක් අතුරුගිරිය වැඩ ඒකකයෙහි දිරාපත් වෙමින් පැවති අතර, වටිනාකම සොයා ගත නොහැකි ජෙනරේටරයක් සහ ට්‍රේලර් රථ 03 ක් ඌණ උපයෝජිතව සහා භූමියෙහි පැවතුණි.

(ආ) ගර්භිත තත්වයෙහි පවතින අංක සොයාගත නොහැකි ට්‍රේලර් 09 ක් අතුරුගිරිය සහා භූමියෙහි දිරාපත් වෙමින් පැවති අතර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 සහ 2015 වර්ෂවල මිලදීගෙන තිබූ වටිනාකම රු.225,150 ක් වූ මාර්ග නාම පුවරු 57 ක් සභා භූමියේ තොග ගබඩාව අසල අනාරක්ෂිතව පැවතුණි.

(ඈ) 2015 ජනවාරි 01 දිනට පෙර මිලදී ගත් වටිනාකම රු.126,836 ක් වූ භාණ්ඩ අයිතම 06 ක තොගයක් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි.

(ඉ) බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය විසින් ප්‍රදානයක් ලෙස සභාවට ලබා දී තිබුණු ජීව්වායු ඒකකය ( වටිනාකම අනාවරණය නොවූ ) වසර ගණනාවක සිට අක්‍රිය තත්වයේ පැවති අතර එය යථා තත්වයට පත්කර කසල කළමනාකරණය සඳහා යොදවා ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

------------------------------------

(අ) කඩුවෙල කසළ කළමනාකරණ අංගනයේ සිට කසළ ප්‍රවාහනය කිරිම වෙනුවෙන් රු.57,071,536 ක වියදමක් 2016 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරුවන් විසින් කසළ බැහැර කරනු ලබන්නේ කවර භූමියකටද යන්න තහවුරු නොකරන ලදි.

(ආ) 2015 මැයි 28 දින ප්‍රසිද්ධ මිළ ගණන් කැඳවීමට අනුව ආයතන 8 ක් විසින් එවා තිබූ මිළ ගණන් අතුරින් ආයතන තුනක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

I. කොන්ත්‍රාත්කරු සමග ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

II. මහනගර සභා ආඥා පනතේ 229 (1) (අ) වගන්තිය ප්‍රකාරව ඇපයක් ලබාගත යුතු වුවද එසේ ලබාගෙන නොතිබුණි.

3.4.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

-------------------------------

2014 වර්ෂය වෙනුවෙන් පැවති කාර්ය සාධන තරගාවලීයේ ජයග්‍රහණ වෙනුවෙන් උපහාර උළෙලක් 2015 දෙසැම්බර් 11 දින පවත්වා තිබූ අතර එහි මුළු වියදම රු.550,000 ක් විය. මෙම වියදමින් සියයට 90ක් එනම් රු.488,000 ක් වැය කර තිබුනේ කටවුට් සහ වේදිකාව අලංකරණය සඳහා විය.

3.5 කොන්ත්‍රාත් පාලනය

----------------------

සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල ව්‍යාපෘති 499 ක් අතරින් ව්‍යාපෘති 12 ක් අතහැර දමා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 25 ක වැඩ අවසන් කර නොතිබුණි.

3.6 හදුනාගත් අලාභ

--------------------

ප්‍රධාන කාර්යාලීය එලිමහන් ගබඩාවේ තිබූ වටිනාකම රු.139,381 ක් වූ කොඩි කණු 141 ක් හා ජයවඩනගම පුස්තකාලයේ පුටු 13 ක් අස්ථානගත වී තිබුණි.

4. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

-------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැය හා තථ්‍ය ආදායම හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------

2016 වර්ෂය සදහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණද, එකී සැලැස්මේ මෙහෙයුම් ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙළ කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සටහන් සැලසුම් සමාලෝචිත වර්ෂය තුළ දී ඉටු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර කොමසාරිස්වරියගේ අවධානයට යොමු කළ අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි ද විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) ආදායම් පරිපාලනය